# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

බුද්ධ ධර්මය - 2 ශ්‍රේණිය ඔක්තෝබර් 3 සතිය

සැකසුම් බලංගොඩ අධ්‍යාපන කලාපය / H.B.C.ප්‍රියදර්ශනී ර/හුණුවල ධර්මරාජ ම.වි

❖ ආදරණීය දුවේ,පුතේ, මම අද ඔයාලට පුංචි කතාවක් කියන්නයි යන්නේ. ඔයාලත් මේ කතාව හොඳට කියවන්න.

ඔන්න පුතේ අපේ බුදු හාමුදුරුවන්ගේ කාලයේ හිටියා රජ කෙනෙක්. එයාගෙ නම තමයි කොසොල් රජතුමා.

මේ රජතුමා උවමනා ප්‍රමාණයට වඩා ආහාර ගන්න කෙනෙක්. ඉතිං මේ රජතුමා ආහාර ගන්න හැම වෙලාවකම ඉන්නෙ හරිම අමාරුවෙන්. හරිම දුකෙන්.

දවසක් පුතේ මේ රජතුමා ප්‍රමාණයට වඩා ආහාර අරගෙන බුදුන් වහන්සේ හමු වෙන්න ගියා. දහදිය දමාගෙන වෙහෙස වෙලා ඇවිත් ඉන්න මේ කොසොල් රජතුමා දැකල බුදුන් වහන්සේ මෙහෙම ඇහුවා.

"මහරජ, ප්‍රමාණයට වඩා ආහාර ගැනීමෙන් සිතටත් ගතටත් දැනෙන්නේ දුකක් නොවේදැ" යි කියලා.

1 දැන් පුතාලා මේ ප්‍රශ්න වලට වාචිකව පිළිතුරු දෙන්න.
- මේ කතාවේ සිටින රජතුමාගේ නම කුමක්ද?
- කොසොල් රජතුමා දුකට පත් වූයේ ඇයි?
- මේ රජතුමාට බුදුන් වහන්සේ දේශනා කළ ගාථාව කියන්න.

ආරෝග්‍ය පරමාලාභා - සන්තුට්ඨී පරමං ධනං

විස්සාස පරමා ඤාති - නිබ්බාන පරමං ධනං

2 කොසොල් රජතුමාගේ පින්තූරයක් සොයා ගන්න. එය පොතේ අලවන්න. ඊට පහළින් බුදුන් වහන්සේ රජතුමාට කිවූ දේ ලියන්න.

3 පහත දැක්වෙන කොටු ඇතුලේ නිරෝගීව සිටීමට කළයුතු දේවල් ලියන්න.

4 දුවේ පුතේ දැන් එයාලා බුද්ධාගම පෙළ පොතේ "නිරෝගී වෙමු" පාඩම කියවන්න.